ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2370/09 – 2024 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා – 2024.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

යොමු අංකය: IR/COM/03/2020/91.
IR/COM/03/2020/203.

කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.10.15 දිනැති හා අංක 2301/62 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. කඩවත, ඇල්දෙණිය, සේද මාවත, අංක 27/2 බී, ලිපිනයෙහි පදිංචි එස්. එම්. ධර්මරත්න මහතා 2. හෝමාගම, පනාගොඩ, ඇඹුල්ගම පාර, අංක 436 ලිපිනයෙහි පදිංචි එම්. එස්. පත්මසිරි මහතා සහ කොළඹ 01, ජනාධිපති මාවත, අංක 30, 12 වන මහල ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 62/2022 හා 2023.12.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්. (රා.ආ.)

2024 ජනවාරි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041371– 25 (2024/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

01. එස්. එම්. ධර්මරත්න
27/2 බී, සේද මාවත, ඇල්දෙණිය, කඩවත.

02. එස්. එම්. පත්මසිරි
අංක 436, ඇඹුල්ගම පාර, පනාගොඩ, හෝමාගම.

ආරාවුල් අංකය: *IR/COM/03/2020/91*
IR/COM/03/2020/203

බේරුම්කරණ අංකය: *A/62/2022*

පැමිණිලිකරුවන්

එදිරිව

ශ්‍රී ලංකා මහ බැංකුව,
12 වන මහළ, අංක 30
ජනාධිපති මාවත, කොළඹ 01.

වගඋත්තරකරු

2023 නොවැම්බර් මස 20 දින දී ය.

බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කරන ලද එස්. එම්. ධර්මරත්න මයා සහ එම්. එස්. පත්මසිරි මයා හට මාණ්ඩලික පන්තියට උසස්වීම් හිමි ද? හිමි නම් එය ලබා නොදීමෙන්, ඔවුන්ට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

පසුබිම

පළමු පාර්ශ්වය විසින් සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දුන් අතර ඒ අනුව පළමු පාර්ශ්වයේ පළමු සාක්ෂිකරු වූ එස්. එම්.

ධර්මරත්න මහතා X1 සිට X13 දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත. පළමු පාර්ශ්වයේ දෙවන සාක්ෂිකරු වූ එම්. එස්. පත්මසිරි මහතා X1 සිට X09 දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ එච්. බී. එස්. දේශප්‍රිය මහතා R1 සිට R19 දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත. දෙපාර්ශ්වය විසින් ම ලිඛිත දේශන මගින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

එස්. එම්. ධර්මරත්න මයා 1986.01.01 දින සිට ද, එම්. එස්. පත්මසිරි මයා 1987.02.02 දින සිට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ සුළු සේවක පන්තියේ (I) ශ්‍රේණියේ සේවකයන් ලෙස සේවයට බැඳී ඇත. ඉන්පසු එස්. එම්. ධර්මරත්න මයා 1989.01.01 දින සිට ද එම්. එස්. පත්මසිරි මයා 1990.02.02 දින සිට ද සුළු සේවකය පන්තියේ (III) ශ්‍රේණියේ ස්ථිර පත්වීම් ලබා දී ඇත. වර්ෂ 1991 අගෝස්තු මස 02 වැනි දින මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද R17 ලෙස ලකුණු කර ඇති "Introduction of a Technical Service in the Central Bank" දරන මුදල් මණ්ඩල පත්‍රිකාව මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉංජිනේරු ස්වරූපයේ රැකියාවල නියුතු සේවකයින් අන්තර්ග්‍රහණය කරමින් මහ බැංකුවේ සාමාන්‍ය සේවාවෙන් වෙනස් හා වෙන් වූ සංවෘත සේවාවක් ශිල්පීය සේවාව ලෙස හඳුන්වා දී ඇති අතර එස්. එම්. ධර්මරත්න මයා 1991.01.01 දින සිට එකී සේවාවේ III ශ්‍රේණියට ද එම්. එස්. පත්මසිරි මයා 1991.08.01 දින සිට එකී සේවාවේ II ශ්‍රේණියට ද අන්තර්ග්‍රහණය කර ඇත.

පළමු පාර්ශ්වයේ එස්. එම්. ධර්මරත්න මයා ප්‍රකාශ කරනු ලබන්නේ වර්ෂ 2015 සිට මාණ්ඩලික ශ්‍රේණිය සඳහා සලකා බැලීමට සුදුසුකම් ලැබූ බවත් නමුත් 2020 වර්ෂයේ හෙතෙම විශ්‍රාම යන තෙක් මාණ්ඩලික ශ්‍රේණියට පත්වීමක් නොලැබූ බවත් ය.

පළමු පාර්ශ්වයේ එම්.එස්. පත්මසිරි මයා ප්‍රකාශ කරනු ලබන්නේ වර්ෂ 2019 සිට මාණ්ඩලික ශ්‍රේණිය සඳහා සලකා බැලීමට සුදුසුකම් ලැබූ බවත් නමුත් 2020 වර්ෂයේ හෙතෙම විශ්‍රාම යන තෙක් මාණ්ඩලික ශ්‍රේණියට පත්වීමක් නොලැබූ බවත් ය.

පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය

පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

01. ශිල්පිය සේවාවේ උසස් කිරීම්වලට අදාළව නිකුත් කර ඇති X3 ලෙස ලකුණු කර ඇති 2007.07.03 දිනැති මානව සම්පත් චක්‍රලේඛ අංක 05/2007/11 දරන ශිල්පීය ශ්‍රේණියට අදාළ වන සංශෝධිත උසස් කිරීමේ පටිපාටිය සහ X3(1) ලෙස ලකුණු කර ඇති එකී පටිපාටියේ V ශ්‍රේණියේ සිට VI ශ්‍රේණියට උසස් කිරීමට අදාළ පටිපාටිය අනුව දෙදෙනාම පිළිවෙලින් 2015 වර්ෂයේ සහ 2019 වර්ෂයේ දී මාණ්ඩලික 1 ශ්‍රේණියට යාමට සුදුසුකම් ලැබූ බවත්, නමුත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් අසාධාරණ සහ අයුක්ති සහගත ලෙස මාණ්ඩලික 1 ශ්‍රේණියේ තත්ත්වය ලබා නොදුන් බවත් :

02. වගඋත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුව උසස්වීම් ලබා දීමේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සිදු කරන බවට දරන ස්ථාවරත්වය පිළිගත නොහැකි බවත්, වගඋත්තරකාර ආයතනය නිශ්චිතව පැවතිය යුතු සේවක සංඛ්‍යාව සහ කාඩරය සම්බන්ධ ලේඛන ඉදිරිපත් කර නොමැති බවත්, අවශ්‍ය අවස්ථාවල දී පවතින තත්ත්වයන් වෙනස් කරමින් අවශ්‍ය පුද්ගලයන්ට උස්ස වීම් ලබා දී ඇති බවත්,

03. වගඋත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුව සෑම විටම චක්‍රලේඛ මතම කටයුතු සිදු නොකරන බවත් චක්‍රලේඛ වරින් වර වෙනස් කරමින් කටයුතු කරන බවත්, සම්මුඛ පරීක්ෂණ සඳහා සෑම විටම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවිය යුතු වුවත් R1 ලේඛනය සමඟ අමුණා ඇති 2017 පෙබරවාරි මස 6 දිනැති ලේඛනය අනුව තිදෙනෙකු මාණ්ඩලික ශ්‍රේණියට බඳවා ගෙන ඇති බවත්, සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමට සුදුසුකම් ලැබූ අය සඳහන් R2 අනුව කැඳවා ඇත්තේ 5 දෙනෙකු පමණක් බවත්, චක්‍රලේඛය අනුව 6 දෙනෙකු කැඳවිය යුතු බවත්,

04. R2 අනුව පළමු පාර්ශ්වයේ පළමු සාක්ෂිකරු වන ධර්මරත්න මහතා සුදුසුකම් ලැයිස්තුවේ 7 වන ස්ථානයේ පසු වූ බවත්, සුදුසුකම් ලැයිස්තුවේ 6 වන ස්ථානයේ පසු වූ ඩබ්ලිව්.එන්. පෙරේරා යන අය සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූයේ නම් ඊලඟ අවස්ථාව ධර්මරත්න මහතාට හිමිවිය යුතු බවත්,

05. 2020 වර්ෂයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ 2019 වර්ෂයේ දී කැඳවිය යුතු වුවත් 2020 වර්ෂය සඳහා එසේ සම්මුඛ පරීක්ෂණය කැඳවූ බවට වගඋත්තරකාර ආයතනය විසින් තහවුරු කිරීමට අසමත් වූ බවත්, එසේ වුවත් ඩබ්ලිව්.එන්. පෙරේරා මහතාට 2020 ජනවාරි මස 09 වන දින උසස් වීමක් ලබා දී ඇති බවත්, උසස් වීමෙන් පසු ඔහු 2020 ජනවාරි මස 14 දින විශ්‍රාම ලබා දී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තවත් බඳවා ගැනීමක් කළ හැකිව තිබූ නමුත් එසේ සිදුකර නොමැති බවත්, ඩබ්ලිව්.එන්. පෙරේරා මහතාට පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බවත්, ඔහු විශ්‍රාම යාමට නියමිත බව දනිමින්ම උසස්වීම් ලබා දී ඇති බවත්,

06. වගඋත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුව සේවක මට්ටම් ඉල්ලීම (Cadre Requirment) සම්බන්ධයෙන් තොරතුරු ලේඛන ඉදිරිපත් කර නොමැති බවත්, වගඋත්තරකාර ආයතනය විසින් 2015, 2016, 2017, 2018, 2019 සහ 2020 යන වර්ෂවල දී කොපමණ මාණ්ඩලික ශ්‍රේණියේ සේවක සංඛ්‍යාවක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සිටිය යුතු ද, මාණ්ඩලික 1 පන්තිය සඳහා එම වර්ෂ වලදී ඇති වූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණ ද, ඒවා සඳහා බඳවා ගැනීම් සිදුකළ ආකාරය කෙසේද යන්න විනිවිද පෙනෙන ආකාරයකින් කරුණු සහිතව ඉදිරිපත් කර නොමැති බවත්,

07. මෙහි පැමිණිලිකාර පාර්ශ්වය කාර්මික ශිල්පීන් ලෙස සේවය කිරීමේ දී ඔවුන්ගේ අත්උදව්කරුවන් වශයෙන් පැමිණි ඇතැම් අය ලිපිකාර සේවයට ගොස් වසර 25 කාර්යයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මාණ්ඩලික 1 ශ්‍රේණිය ලබා ගෙන ඇති බවත්, ලිපිකාර සේවයේ නියුතු අය වසර 25 ක් සම්පූර්ණ කිරීමෙන් නිරායාසයෙන් මාණ්ඩලික 1 ශ්‍රේණියට ඇතුළත් වන බවත්, මෙම සේවකයන් අවුරුදු තිස් ගණනක් සේවය කිරීමෙන් අනතුරුවවත් එසේ මාණ්ඩලික 1 ශ්‍රේණියට ඇතුළත් වීමට අවස්ථාවක් ලබා නොදීමෙන් බරපතල අසාධාරණයක් සිදු වී ඇති බවත්,

08. ඒ අනුව පැමිණිලිකාර පාර්ශ්වය වන එස්.එම්. ධර්මරත්න මහතා සහ එම්.එස්. පත්මසිරි මහතාට මාණ්ඩලික 1 ශ්‍රේණිය සඳහා පත්වීම් ලබා නොදීමෙන් අසාධාරණක් සහ අයුක්තියක් සිදු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය</u>

වගඋත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් එහි ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ එච්.බී.එස්. දේශප්‍රිය මහතා ලබාදුන් සාක්ෂි සහ ලිඛිත දේශනය මගින් පහත නෛතික ස්ථාවරය දක්වා සිටී.

01. පැමිණිලිකාර එස්.එම්. ධර්මරත්න මහතා සහ එම්. එස්. පත්මසිරි මහතා සම්බන්ධයෙන් පරීක්ෂණයට අදාළ කාලපරිච්ජේදයට අදාළ වන මුදල් නීති පනතේ 10 (a) වගන්තිය ප්‍රකාරව, 22 හා 23 වගන්තිවලට යටත්ව මුදල් මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟෙන පරිදි මහ බැංකුවට සේවකයින්, නිලධාරීන් පත් කිරීම, ඔවුන් ඉවත් කිරීම හෝ සේවයෙන් පහ කිරීම, වැටුප්, වේතන හෝ වෙනත් ගෙවීම් නියම කිරීම හා සේවා කොන්දේසි නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇති බවත්, ඒ අනුව 1991 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ එවකට සේවය කරනු ලැබූ ශිල්පීය සේවකයින් සහ ඉංජිනේරු ස්වරූපයේ රාජකාරිවල නියුතු වූ සේවකයන් සඳහා බැංකුවේ සාමාන්‍ය සේවාවෙන් වෙනස් හා වෙන් වූ සංවෘත සේවයක් ලෙස R17 ලෙස ලකුණු කර ඇති ශිල්පීය සේවාවක් හඳුන්වා දී ඇති බවත්, පැමිණිලිකාර ධර්මරත්න මහතා 1986.01.01 දින සුළු සේවක පන්තිය (1 ශ්‍රේණිය) ට බඳවා ගෙන ඇති බවත්, 1991.01.01 දින සිට ශිල්පීය සේවය (1II ශ්‍රේණිය) ට අන්තර්ග්‍රහණය කර ඇති බවත්, පැමිණිලිකාර පත්මසිරි මහතා 1987.02.02 දින සුළු සේවක පන්තිය (1 ශ්‍රේණිය) ට බඳවා ගෙන ඇති බවත්, 1991.08.01 දින සිට ශිල්පීය සේවය (1I ශ්‍රේණිය) ට අන්තර්ග්‍රහණය කර ඇති බවත්,

02. ශිල්පීය සේවාව ස්ථාපිත කිරීමේ දී සාමාන්‍ය සේවයේ ශ්‍රේණි සමග ගැලපීමක් සිදු කර ඇති බවත්, ධර්මරත්න මහතාගේ පළපුරුද්ද සහ අවුරුදු 05 ක සේවා කාලය සැලකීමට ගෙන ඔහු ශිල්පීය සේවාවේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති බවත්, පත්මසිරි මහතාගේ අවුරුදු 04ක සේවා කාලය සැලකීමට ගෙන ඔහු ශිල්පීය සේවාවේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති බවත්,එවකට ඔවුන් සිටි ශ්‍රේණිවලට සමගාමීව ශිල්පීය සේවාවේ ඉහළ ශ්‍රේණියකට ද හා ඊට අනුරූපව වැටුප් හා වේතනවල සාධනීය වැඩි කිරීමක් සිදුකර ඇති බවත්,ශිල්පීය සේවාව මගින් විධිමත් උසස්වීම් පටිපාටියක් හඳුන්වා දී ඇති බවත් පැමිණිලිකාර

පාර්ශ්වය එකී අන්තර්ග්‍රහණය සිදුකිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් දක්වා නොමැති බවත්, එසේ විරෝධතාවයක් දක්වා නැති බව හරස් ප්‍රශ්න විමසීමේ දී ප්‍රකාශිතව පිළිගෙන ඇති බවත්,

03. පළමු පාර්ශ්වය විසින් වගඋත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කර ඇති X6 සිට X10 දක්වා ලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛන මගින් හෝ වෙනත් කිසිඳු ලේඛනයක් මගින් ශිල්පීය සේවාවේ සිටින පැමිණිලිකාර පාර්ශ්වය නැවත සාමාන්‍ය සේවාව වෙත අන්තර්ග්‍රහණය කරන මෙන් ඉල්ලීමක් සිදු කර නොමැති අතර, එසේ ඉල්ලීමක් සිදු නොකළ බව හරස් ප්‍රශ්න විමසීමේ දී ඒ බව තහවුරු වූ බවත්,

04. ශිල්පීය සේවාව යනු ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ඇති එක් සංවෘත සේවයක් වන අතර ශිල්පීය සේවාව සඳහා පොදු උසස් වීම් පටිපාටිය අදාළ නොවන බවත්, ශිල්පීය සේවාව සඳහා අදාළ වනුයේ පැමිණිලිකාර පාර්ශ්වය විසින් X3 හා X3 (1) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති පටිපාටිය බවත්, එකී චක්‍රලේඛය අනුව ශිල්පීය සේවාවේ V ශ්‍රේණියේ වසර 08 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සහ ශිල්පීය සේවාවේ VI ශ්‍රේණියේ සේවකයන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව මාණ්ඩලික පන්තියට (ශිල්පීය සේවාවේ VII ශ්‍රේණිය) උසස්වීම් සඳහා සළකා බැලීමට සුදුසුකම් ලබන බවත්, 1999.07.21 දිනැති චක්‍රලේක අංක 05/02/001/0001 /001 අනුව සුදුසුකම් ලබන සේවකයින් ශ්‍රේණිගත කිරීම සිදු කරනු ලබන බවත්, ඒ අනුව ජ්‍යෙෂ්ඨත්වය මත පදනම්ව ශිල්පීය සේවාවේ V/ VI ශ්‍රේණිවල සේවය කරන ලද සේවා කාලය පදනම්ව ලකුණු 40%ක් ද, උසස් වීම් සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගේ පසුගිය වසර 4 ක කාර්යය සාධක ඇගයීම් ලකුණු මත පදනම්ව ලකුණු 50% ක් ද, ශිල්පීය සේවාවේ V/ VI ශ්‍රේණිවල සේවා කාලය මත පදනම්ව එක් වසරක් සඳහා ලකුණු එක බැගින් උපරිම වශයෙන් ලකුණු 10% ක්ද ලබා දෙන බවත්, එකී ලකුණු පදනම්ව ශ්‍රේණිගත කරනු ලැබූ සේවකයන් ඇති වී ඇති පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන සේවක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන බවත්,

05. ශිල්පීය සේවාවේ පුරප්පාඩු ඇති වන්නේ සේවාවේ සේවකයන් විශ්‍රාමයාමෙන් වන අතර බවත් ඇතැම් අවස්ථාවල දී ශිල්පීය සේවක අවශ්‍යතාවය මත අතිරේක සේවක සංඛ්‍යාවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළ හැකි බවත්, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින් සංඛ්‍යාව තීරණය කිරීම හෝ ඉහළ නැංවීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි සිදු කළ නොහැකි බවත් එය ඔහුගේ නිර්දේශ මත මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතු බවත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මැදිහත්වීම ඇත්තේ පුරප්පාඩු සංඛ්‍යාව නිර්දේශ කිරීමට පමණක් වන අතර ශ්‍රේණිගත කිරීම සඳහා හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මැදිහත් වීමක් නොමැති බවත්, ශිල්පීය සේවාවේ මාණ්ඩලික පන්තියට උසස්වීම් ලබාදෙනුයේ ඇති වන පුරප්පාඩු මත පමණක් වන බවත්,

06. 2015, 2018 සහ 2019 වර්ෂවල දී ශිල්පීය සේවාවේ මාණ්ඩලික පන්තියේ පුරප්පාඩු ඇති වී ඇති බවත්, 2016 හා 2017 වර්ෂ වල දී පුරප්පාඩු ඇති වී නොමැති බවත්, මාණ්ඩලික පන්තියට උසස්වීම සඳහා සුදුසුකම් සලකා බැලීමට ධර්මරත්න මහතා 2015 වර්ෂයේ සිට ද පත්මසිරි මහතා 2019 වර්ෂයේ සිට ද සුදුසුකම් ලබා ඇති බවත්, වර්ෂ 2015 වර්ෂයේ විශාම යාම හේතුවෙන් එක් පුරප්පාඩුවක් ඇති වී ඇති අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ ඉල්ලීම පරිදි තවත් පුරප්පාඩු 2 ක් සහිතව පුරප්පාඩු 3 ක් සඳහා 2017 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ සඳහා 6 දෙනෙකු තෝරා ගෙන ඇති බවත්, ධර්මරත්න මහතා ලබාගෙන ඇති ලකුණු අනුව 7 වන ස්ථානයේ පසු වූ හෙයින් එකී සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා නොමැති බවත්, 2018 වර්ෂයේ ඇති වූ එක් පුරප්පාඩුවක් සඳහා 2019 වර්ෂයේ දී දෙදෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත් ධර්මරත්න මහතා ශ්‍රේණිගත කිරීමේ දී 03 වන ස්ථානයේ සිටි බැවින් එකී සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාව හිමි නොවී ඇති බවත්, 2019 වර්ෂයේ දී එක් පුරප්පාඩුවක් ඇති වූ බවත් ඒ සඳහා 2020 මැද භාගයේ සම්මුඛ පරීක්ෂණ කැඳ වූ බවත් ඒ වන විට පැමිණිලිකාර පාර්ශ්වය විශ්‍රාම ගොස් ඇති බැවින් එකී සම්මුඛ පරීක්ෂණ සඳහා අවස්ථාවක් ලබා නොමැති බවත්,

07. ධර්මරත්න මහතා සහ පත්මසිරි මහතාගේ මූලික සාක්ෂි ලබාදුන් දිවුරුම් ප්‍රකාශයේ 17 වැනි ප්‍රකාශයේ සඳහන් ඩබ්. එන්. පෙරේරා මහතා මාණ්ඩලික පන්තියට උසස්වීම් සඳහා 2019 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා ඇති බවත් එකී සම්මුඛ පරීක්ෂණයෙන් ඔහු තේරීපත් වී ඇති බවත් ඒ අනුව 2020 වර්ෂයේ උසස්වීම් ලබා දී ඇත්තේ X3 චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටියට බවත්,

08. ශිල්පීය සේවයට අදාළ උසස්වීම් පටිපාටිය අනුව මාණ්ඩලික පන්තියට උසස් වීමක් ලැබීමට සලකා බලනුයේ X3 චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ශිල්පීය සේවාවේ V/VI ශ්‍රේණිවල සේවය කරනු ලැබූ සේවා කාලය වසර 08 ක් සම්පූර්ණ වීම මිස මහ බැංකුවේ

සේවය කරනු ලැබූ සමස්ථ කාලය සළකා බැලීමෙන් නොවන බවත්,

09. ධර්මරත්න මහතා සහ පත්මසිරි මහතාගේ දිවුරුම් ප්‍රකාශයන්හි පිළිවෙළින් 12 හා 11 වැනි ප්‍රකාශ මගින් දක්වා ඇති කරුණු සාවද්‍ය බවත්,

10. ධර්මරත්න මහතා සහ පත්ම සිරි මහතාගේ දිවුරුම් ප්‍රකාශයන්හි පිළිවෙළින් 13, 14, 15, 16 හා 12, 13. 14. 15 වැනි ප්‍රකාශ මගින් දක්වා ඇති කරුණු මගින් ප්‍රකාශිත සේවකයන්ගේ උසස්වීම් සඳහා අදාළ වනුයේ X3 උසස්වීම පටිපාටිය නොවන බවත්, ඔවුන්ට අදාළ වනුයේ සාමාන්‍ය සේවයේ මාණ්ඩලික පන්තියට උසස් වීම් ලබා දීම සඳහා අදාළ වන උසස්වීම් පටිපාටිය බවත්, මෙම උසස් වීම් පටිපාටි දෙක සංසන්දනාත්මකව සලකා බැලිය නොහැකි බවත්, එකී දිවුරුම් ප්‍රකාශ මගින් අධිකරණය නොමග යවන සුළු ප්‍රකාශ සිදු කර ඇති බවත්,

11. පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ධර්මරත්න මහතා 2020.03.30 දින හා පත්මසිරි මහතා 2020.04.07 දින විශ්‍රාම ලබා ඇති බවත්, ඔවුන් එම අවස්ථාවේ සේවය කළ තනතුරුවලට අදාලව සිය විශ්‍රාම වැටුප සහ අනෙකුත් වරප්‍රසාද පිළිගෙන තිබෙන බවත්, ඒ අනුව පළමු පාර්ශ්වය විසින් තමන් සේවය කළ ශිල්පීය සේවාවේ VI ශ්‍රේණියට අදාළව සියලු වරප්‍රසාද පිළිගෙන තිබෙන බවත්. Approbate and Reprobate (quod approbo non reprobo) සිද්ධාන්තයට අනුව යම් කිසි අයෙකුට එකම අවස්ථාවේ දී යම් කරුණක් පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීම එකවිට සිදු කළ නොහැකි බවත් ඒ අනුව පළමු පාර්ශ්වය තමා සේවය කළ අවස්ථාවේ තම තනතුරු වලට අදාළ විශ්‍රාම වරප්‍රසාද පිළිගැනීමටත් එම තනතුරු හෝ සේවාවන් ප්‍රතික්ෂේප කිරීමත් එකවිට සිදුකළ නොහැකි බවත්, පළමු පාර්ශ්වයට හිමි සියලුම උසස්වීම් නිසි ආකාරයෙන් ලබා දී ඇති බවත්, මාණ්ඩලික පන්තියට උසස්වීම් ලැබීම සඳහා සලකා බැලීමට පළමු පාර්ශ්වය සුදුසුකම් ලැබුව ද එම උසස්වීම් සඳහා ඇති තරගකාරී බව නිසා පළමු පාර්ශ්වයට වඩා සුදුසුකම් ලත් පුද්ගලයන් සිටි නිසා වැඩි සුදුසුකම් ලත් පුද්ගලයන් සඳහා උසස්වීම් හිමි වූ බවත් ඉහත සියලු කරුණු අනුව උසස්වීම් නොලැබී යාම අභියෝගයට ලක් කිරීමට කිසිදු සාධාරණ පදනමක් පැමිණිලිකාර පළමු පාර්ශ්වයට නොමැති බවටත් කරුණු ඉදිරිපත් කර ඇත.

<u>තීන්දුව</u>

දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි, ගොනු කරන ලද ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇති සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත තීරණයට එළඹියෙමි.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන එස්. එම්. ධර්මරත්න මහතා සහ එම්. එස්. පත්මසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිල්පීය සේවාවේ සේවකයන් ලෙස අන්තර්ග්‍රහණය වී ඇති බැවින් ඔවුන්ගේ උසස්වීම සඳහා බලපානුයේ X3 බව දෙපාර්ශ්වයම පිළිගෙන ඇත. එකී පටිපාටියේ දක්වා ඇති පරිදි ශිල්පීය සේවාවේ V සහ VI ශ්‍රේණිවල සිට VII ශ්‍රේණියට උසස් කිරීමට අදාළ වන විධිවිධාන පහත පරිදි දැක්විය හැකිය.

'' මා.ප. 1 ශ්‍රේණියට (පොදු සේවාවට සහ සංවෘත සේවාවන්ට) බාහිර අපේක්ෂකයින් බඳවා ගැනීමට සමාන්තරව අභ්‍යන්තර උසස් කිරීම සලකා බලනු ලබන අවස්ථාවන්හිදී පවතින පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව සම්මුඛ පරීක්ෂණ මගින් ශි. සේ. VII ශ්‍රේණියට උසස් කිරීම සඳහා පහත සඳහන් නිර්ණායකයන්ගෙන් එකක් හෝ සපුරා ඇති නිලධාරීන් සලකා බලනු ලැබේ.

I අවසාන වසර 05 සඳහා කාර්ය සාධන ඇගයීම් ලකුණුවල සාමාන්‍ය අවමය සියයට 80ක් සහිත ශි සේ. VI ශ්‍රේණියේ සේවා නියුක්තිකයින් සහ ශි. සේ. V ශ්‍රේණියේ වසර 8 ක සේවාවක් සපුරා ඇති සේවා නියුක්තිකයින් VII ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබයි. ''

එකී X3 ලෙස ලකුණු කර ඇති චක්‍රලේඛය මගින් පැහැදිලිව සඳහන් කර ඇත්තේ එකී සුදුසුකම් සපුරන සේවා නියුක්තිකයින් VII ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබන බව මිස එය අනිවාර්ය වශයෙන් එකී VII ශ්‍රේණිය ලැබීමට සුදුසුකමක් නොවන්නේය.

ඒ අනුව VII ශ්‍රේණියට උසස් වීම සඳහා පැමිණිලිකාර පාර්ශ්වයේ සේවා කාලය ගණනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවට

සේවයට බැඳුණු ආරම්භක දින සිට නොව V ශ්‍රේණිය ලැබූ දින සිට වසර 08 ක් සම්පූර්ණ වූ දින සිට හෝ VI ශ්‍රේණිය ලැබූ දින සිටය.

ධර්මරත්න මහතා 2007.01.01 දින සිට V ශ්‍රේණියට උසස් වීම් ලැබ ඇති අතර 2017.01.01 දින VI ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත. ඒ අනුව ධර්මරත්න මහතා VII ශ්‍රේණියට උසස්වීම සඳහා සලකා බැලිය යුතු දිනය වන්නේ 2015.01.01 දින සිටය. පත්මසිරි මහතා 2011.02.01 දින සිට V ශ්‍රේණියට උසස් වීම් ලැබ ඇති අතර ඒ අනුව VII ශ්‍රේණියට උසස්වීම සඳහා සලකා බැලිය යුතු දිනය වන්නේ 2019.02.01 දින සිට ය.

පැමිණිලිකාර පාර්ශ්වයේ එස්. එම්. ධර්මරත්න මහතාගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයේ 5, 1, 13, 14, 15, 16 සහ 17 මගින් ද, එම්. එස්. පත්මසිරි මහතාගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයේ 11, 12. 13. 14. 15 සහ 17 ඉදිරිපත් කර තිබූ ප්‍රකාශ මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයේ නියුතු සේවකයින් පිරිසකගේ නම් සඳහන් කරමින් උසස්වීම් ප්‍රශ්නගත කර අභියෝගයට ලක් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් වග උත්තරකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රශ්නගත නිලධාරීන්ගේ පෞද්ගලික දත්ත සටහන්, කාර්ය සාධන ඇගයීම් ලකුණු ආදී ඇතුළත් රහස්‍ය තොරතුරු සහතික කර පැමිණිලිකාර පාර්ශවයට ද පිටපත් සහිතව බේරුම්කරණ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඒ සියලු තොරතුරු පරික්ෂා කිරීමේ දී තහවුරු වනුයේ පැමිණිලිකාර පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කර ඇති කරුණු වැරදි තොරතුරු මත ප්‍රකාශ කරන ලද සාවද්‍ය සහ නොමග යවන සුළු කරුණු බවයි.

ශිල්පීය සේවාවේ VII ශ්‍රේණියට උසස්වීම සඳහා වර්ෂ 2015 දී පුරප්පාඩු 03 ක් සඳහා අපේක්ෂකයන් 06 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇත. වග උත්තරකාර ආයතනය ලකුණු කර ඇති R2 ලේඛනය අනුව එකී වර්ෂයේ දී සුදුසුකම් ලැබීමේ ලකුණු සටහනේ 07 ස්ථානයේ එස්. එම්. ධර්මරත්න මහතාට හිමි වී ඇති අතර ඔහු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා නොමැත. එකී සුදුසුකම් ලැබීමේ ලැයිස්තුවේ 06 ස්ථානයේ පසු වූ ඩබ්. එන්. පෙරේරා මහතා සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වී නොමැත. ඔහු සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවීම මත 07 වෙනි ස්ථානයේ පසු වූ ධර්මරත්න මහතා කැඳවිය යුතුයැයි පැමිණිලිකාර පාර්ශ්වයෙන් ඉදිරිපත් කර ඇති ස්ථාවරයට නෛතික පදනමක් නොමැත.

2018 වර්ෂයේ දී පුරප්පාඩු 01ක් සඳහා අපේක්ෂකයන් දෙදෙනකු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර R3 (1) ලේඛනය අනුව ඒකී වර්ෂයේ දී සුදුසුකම් ලැබීමේ ලකුණු සටහනේ 03 ස්ථානයේ එස්. එම්. ධර්මරත්න මහතාට හිමි වී ඇති අතර ඔහු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා නොමැත. 2019.12.31 දින වන විට එම වර්ෂයේ දී ඇති වූ පුරප්පාඩු 01 සඳහා සම්මුඛ පරීක්ෂණ කටයුතු 2020 මැද දී ආරම්භ කර ඇති අතර ඒ වන විට ධර්මරත්න මහතා විශ්‍රාම ලබා ඇත.

එම්. එස්. පත්මසිරි මහතා VII ශ්‍රේණියට උසස්වීම සඳහා සලකා බැලිය යුතු දිනය වන්නේ 2019.02.01 දින සිට වන බැවින් ඔහු විශ්‍රාම ලැබූ 2020.04.07 දින අතර කාලය තුළ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වී නොමැති බැවින් ඔහුට සම්මුඛ පරීක්ෂණයක් සඳහා සහභාගී වීමට අවස්ථාවක් හිමි වී නොමැත.

X3 ලෙස ලකුණු කර ඇති 2007.07.03 දිනැති මානව සම්පත් චක්‍රලේඛ අංක 05/2007/11 දරන ශිල්පීය ශ්‍රේණියට අදාළ වන සංශෝධිත උසස් කිරීමේ පටිපාටිය සහ X 3(1) ලෙස ලකුණු කර ඇති එකී පටිපාටියේ V ශ්‍රේණියේ සිට VI ශ්‍රේණියට උසස් කිරීමට අදාළ පටිපාටිය අනුව උසස් වීම් සඳහා සලකා බැලීමට සුදුසු වීම යනු සුදුසුකමක් මිස උසස්වීමක් ලබා දිය යුතු අනිවාර්ය නියමයක් නොවේ.

දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරනු ලැබූ සියලු කරුණු සලකා බැලීමි. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ,
බේරුම්කරු,

2023 දෙසැම්බර් මස 30 වැනි දින.

EOG 02-0034

මගේ අංකය: IR/COM/03/2023/07.

කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ 2023.11.25 දිනැති හා අංක 2359/61 දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, කොළඹ 10, විනයාලංකාර මාවත, අංක 49/1 ලිපිනයෙහි පිහිටි සංස්ථා හා පොදු සේවක සංගමය සහ කොළඹ 02, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, අංක 130 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/73/2023 හා 2023.12.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ).

2024 ජනවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ.

යොමු අංකය: IR/COM/03/2023/07.
නඩු අංකය: A/73/2023.

පළමු පාර්ශ්වය

1. සංස්ථා හා පොදු සේවක සංගමය,
අංක 49/1,
විනයාලංකාර මාවත,
කොළඹ 10.

(කිසිවෙකු පෙනී නොසිටින ලදී.)

පැමිණිලිකාර පළමු පාර්ශ්වය

එදිරිව :

දෙවන පාර්ශ්වය

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව,
අංක 130,
ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

කළමනාකරණ සහකාර
කේ.කේ.එස්. රුක්ෂිකා මෙනවිය
සමග නීතිඥ දිල්මි ජයතිස්ස
මෙනවිය පෙනී සිටින ලදී.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය

<u>ප්‍රදානය</u>

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර මහතා විසින් අංක 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය

අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 22/11/2023 දිනැති නියෝග යේ බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට හේතු වී ඇති කරුණු

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කරුණට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවය කරන ජේ.ඒ.එන්.ජී. රණසිංහ මහතාට 2008/05/02 දින සේවය ස්ථිර කරන අවස්ථාවේ දී 14 ශ්‍රේණිය පැස්සුම්කරු තනතුර ලබා නොදීම සම්බන්ධවයි.

පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය

මෙම පරීක්ෂණය 13.12.2023 දින මුල්වරට කැඳවන ලදී. එදින දෙවන පාර්ශ්වය වෙනුවෙන් කළමනාකාර සහකාර සහ නීතිඥ දිල්මි ජයතිස්ස මෙනවිය පෙනී සිටින ලදී. මෙම පරීක්ෂණය එම දින පෙරවරු 10.00 පැයට පවත්වන බව 2023.11.27 වන දින ලියාපදිංචි අංක 2329 දරන ලියාපදිංචි තැපෑලෙන් දන්වන ලදී.

මෙම දින පෙරවරු 10.00 ට පරීක්ෂණ පවත්වන බවත් නමුත් 10.30 වනතෙක් පළමු පාර්ශ්වය වෙනුවෙන් කිසිවෙකුත් පැමිණියේ නැත. නමුත් දුරකථන පණිවුඩයකින්වත් නොපැමිණෙන බව පවසා නැත.

තීරණය

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන 27.11.2023 ලිපියේ ඡේද අංක 02 යටතේ ඒක පාක්ෂිකව මෙම ඉල්ලීම තවදුරටත් පරීක්ෂණයට පත් නොකර රජයේ මිල මුදල් නිරපරාදේ වියදම් නොකිරීමටත්, ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන මෙම ඉල්ලීම නිෂ්ප්‍රභ කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත බවට ප්‍රකාශ කරමි.

කපිතාන් එම්.ජී.ජී. මෙන්ඩිස්,
බේරුම්කරු.

2023 දෙසැම්බර් මස 27 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 02 - 0035

මගේ අංකය: IR/COM/04/E/2014/84.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

අංක 2344/14 දරන හා 2023.08.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් රත්මලාන, අත්තිඩිය පාර, අංක 105/14 හි පිහිටි ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය (සේවකයින් 50 දෙනා වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A /51/2020 දරන හා 2023.06.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A/51/2020 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.08.07 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ).

2024 ජනවාරි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම.

ලිපිනය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, තැ.පෙ. 14, ගාලු පාර, රත්මලාන.
දිනය: 2023.10.30

කම්කරු කොමසාරිස් ජනරාල් තුමා,
කම්කරු කොමසාරිස් මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට.

2023.08.07 දිනැති අංක 2344/14 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද්දාවූ ද අංක A/51/2020 දරන ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය බැඳී සිටින්නා වූ ද 2023.06.21 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සාමාන්‍යාධිකාරි,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

පිටපත්: (අනෙක් පාර්ශ්වය)

ජලපවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය (ප්‍රදානය අදාළ වන සේවකයින් 50 දෙනාගේ නම් අමුණා ඇති උපලේඛනයේ සඳහන් වේ.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද, වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 02 - 0036

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.